මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.07.15
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208


## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
## 2022.07.12 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස මාසික සභා රැස්වීම 2022.07.12 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

<u>ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා</u>

2022.06.15 සභා වාර්තාවේ 22 පිටුවේ මම කරපු කතාව “මාලිම්බඩ කොට්ඨාසයේ කසල අපි ගන්නෙ නෑ ” කියන එක “මාලිම්බඩ ඇහලුම් ශාලාවේ කසල” ලෙස සංශෝධනය විය යුතුයි.

ඉහත සංශෝධනයට යටත්ව 2022 ජුනි මස 15 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව 2022.06.15 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

***02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

ජපානයේ හිටපු අගමැති ශින්සෝ අබේ මහතාගේ අභාවය සම්බන්ධයෙන් අද දින ජාතික ශෝක දිනයක් කරල තියෙනවා. එතුමා තමයි ජපානය ගොඩනැගුවේ.එතුමා වෙනුවෙන් ශෝකය පලකිරීමක් ලෙස සියලු දෙනා නැගිට විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වමු.

***03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- නො 484/1, පිංකුඹුරේ ගෙදර, කපුහේන, අකුරුගොඩ හි ඊ.එල්.සඳුන් ලක්මාල් යන අය විසින් ඉදිරිපත් කරන ලද "මායිමේ ඇති ගස් සම්බන්ධවයි " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- නො.18, අත්මගහේන,අකුරැස්ස පාර, මාලිම්බඩ හි කේ.කේ.මදරසිංහ යන අය විසින් ඉදිරිපත් කර තිබූ "නිවෙස්වලට යන පාර රූටා යාම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- පළාත් පාලන කොමසාරිස්, ගාල්ල මගින් එවන ලද "පළාත් පාලන ආයතන සමග කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ඒදණ්ඩවිල, සුල්තානාගොඩ හි බී.විතාන යන අය විසින් ඉදිරිපත් කර තිබූ "වගා කිරීම පිණිස ඉඩම් කොටසක් ලබා ගැනීම සඳහායි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- නාකන්දගොඩදෙනිය, මාලිම්බඩ, පාලටුව හි කේ.ඩබ්.ආරියදාස යන අය විසින් ඉදිරිපත් කර තිබූ "නිවසට අනතුරුදායක පැතිබැම්මක් සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ජාතික විගණන කාර්යාලය මගින් එවා තිබූ මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර සභාව වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව සභාගත කරන ලදී.
- වැඩ අවසන් කරන ලද හොරගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ කනත්ත පාර දෙනිපිටිය ගෙදර අසල සිට ඉදිරියට කැටගල් ඇල්ලීමේ කර්මාන්ත සඳහා මුදල් ලබා ගැනීම සම්බන්ධව පහළ කියාඩුව සරණ ප්‍රජා මණ්ඩලය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.
- සමගි ප්‍රජා මූල සංවිධානය, හොරගොඩ, තෙලිජ්ජවිල මගින් එවන ලද "මුස්ලිම් ගම්මානය දක්වා ජලය දීර්ඝ කිරීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

<u>**යෝජනා අංක 5:1**</u>

2022/05/31 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

2022/05/31 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2022/06/15 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2022/06/15 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව ක්‍රියාත්මක කල සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව ක්‍රියාත්මක කළ සංවර්ධන යෝජනා වෙනුවෙන් ගෙවිය යුතු මුදල් අදාළ අමාත්‍යාංශ වලින් ගෙවීමට ප්‍රමාද වන්නේ නම් පසුව ලබා ගැනීමේ පදනම මත කොන්ත්‍රාත් මුදල් කොන්ත්‍රාත් කරුවන්ට ලබා දීම සඳහා දේශීය ණය අරමුදලින් ණයක් ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

මේ යෝජනාව දැම්මෙ මේක සභාවේ අනුමත කරල පළාත් පාලන කොමසාරිස් වෙත යවල අනුමැතිය ගන්න. අනුමත වෙලා ආවොත් තමයි මේ ණය මුදල ගන්නෙ.

<u>ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා</u>

මේ යෝජනාවට අදාළව ගිය වසරේ දෙසැම්බර් 31 ට පෙර නිම කළ යුතු කර්මාන්ත සම්බන්ධව අපි කොළඹ ගිහිල්ල සාකච්ඡා කළා. වැඩ යෝජනා විෂය භාර අමාත්‍යතුමා එදා පැහැදිලි ප්‍රකාශයක් කළා මුදල් සම්බන්ධ ගැටලුවක් නැහැ හය නැතිව වැඩ කරන්න කියලා. ඒ ප්‍රකාශයත් සමග අපි ඇවිල්ල වැඩ ආරම්භ කළා. කොට්ඨාසයේ මන්ත්‍රීතුමත් සමගම අපි වැඩ කටයුතු කරල දෙසැම්බර් 31 වෙනකොට කර්මාන්ත 03 ක වැඩ අවසන් කළා. මොන හේතුවක් නිසා හෝ මාලිම්බඩ සභාවේ වැඩ ප්‍රමාද වුණා කියන එක තමයි මගේ හැඟීම. තිහගොඩ කර්මාන්ත ගොඩක් කරල ඒ සල්ලිත් ගොඩක් ලැබිල තියෙනවා. මාලිම්බඩ වැඩ ප්‍රමාදවීම මත හෝ ලිපිගොනු යැවීම ප්‍රමාදවීම මත මම දන්න තරමට අපිට මුදල් ලැබිල තියෙන්නෙ කර්මාන්ත 04 ක විතරයි. සභාපතිතුමනි, ඔබ ගැන විශ්වාසය , ඔබතුමාගේ ප්‍රකාශය එක්ක තමයි අපි හය නැතිව මේ කර්මාන්ත කිරීමට ඉදිරිපත් වුණේ. හොරගොඩ වසමේ වැඩ පටන් ගත්තෙ දෙසැම්බර් 18, 19 වගේ දිනවල. එහෙම කරලත් අපි වැඩ් මීළට

සිමෙන්ති අරගෙන කර්මාන්තකරුවෝ එක්ක මැදිහත්වෙලා දෙසැම්බර් 31 වෙනකොට වැඩ ටික අවසන් කර ගත්තා. හැබැයි අද වෙනකොට ඒ මුදල් නොලැබීම මත ඒ කර්මාන්තකරුවෝ විශාල අර්බුදයකට මුහුණ පාලා ඉන්නවා. ණයට ගනිපු මුදල් වලට පොළී ගෙවන්න ගියාම මුදල් පොළියට ගනිද්දි තිබුණු පොළිය නෙමෙයි දැන් තියෙන්නෙ. ඊට එහා පොළියක්. අතේ තිබුණු සල්ලිවලට නෙමෙයි මුදල් ණයට අරන් ඒ මිනිස්සු මේ වැඩ කරල තියෙන්නෙ. අදවෙනකොට අපට ඒ මිනිස්සුන්ට දෙන්න උත්තර නැතිවෙලා තියෙනවා.

ගරු සභාපතිතුමනි ඔබතුමාගේ යෝජනාව අනුව එහෙම ණය මුදලක් ගත්තොත් පොළිය සම්බන්ධව ගැටලුවක් එනවා. මම ඉල්ලීමක් කරනවා ඊට පෙර මේ කර්මාන්ත කරුවෝ සංඛ්‍යාවත්, ගෙවිය යුතු මුදල් ප්‍රමාණයත් ගණනය කරල මේ කර්මාන්ත කරුවෝ මුදල් ඉල්ලල අපට කරදර කරනවා.මේ මුදල් ටික ඉක්මනින් ලබා දෙන්න කියල මේ මුදල් එවිය යුතු ආයතනවලට අපේ සභාව හරහා පොඩි බලපෑමක් කරන්න කියලා.ඒ ආකාරයට ඉල්ලීමක් කරල ඒ මුදල් ටික කඩිනමින් ගෙන්න ගන්න පුළුවන්ද කියල පළමුව බලමු කියල මම යෝජනා කරනවා.

ඊට අමතරව ඔබතුමා මීට පෙර යෝජනා කළ පරිදි එම මුදල් සහා අරමුදලින් ගෙවීමට හැකියාවක් තියෙනවා නම් ඒ පිළිබඳවත් අවශ්‍ය කටයුතු කරල යම් මුදලක් හෝ ලබා දීල සහනයක් සලසන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.ණය මුදල ගැටලුවක් වෙනවනම් මේ යෝජනාව ගැන සලකා බලා ඒ මුදල් කඩිනමින් ලබා දෙන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>

සභාපතිතුමා යෝජනාවක් ගෙනාවා පහුගිය කාල වකවානුව තුළ සංවර්ධන වැඩ කරපුවට රජයෙන් මුදල් ලැබිල නැහැ ඒ මුදල් අපි ගෙවන්නෙ කොහොමද නැත්නම් අපි ණයක් ගන්න ඕන කියලා. මීට පෙර සභාවකදිත් මේ කොන්ත්‍රාත්කරුවෝ අපි එක්ක කතා කළා. ඇත්තටම ඒ අය ගොඩක් අපහසුවෙන් ඉන්නෙ. උදයසාන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ කනකර උකස් කරල නැත්නම් ඉඩම් උකස කරල OD කරල බැංකුවල තිබ්ච්ච සල්ලි අරගෙන තමයි මේ සංවර්ධන වැඩ කරල තියෙන්නෙ. දැන් මාස 5ක් 6ක් වෙන ඒවත් තියෙනවා. අපිට තාම මුදල් ලැබිල නෑ කියල එදා අපි සභාපතිතුමාගෙන් ඇහුවම සභාපතිතුමා කිව්වා අපි ගිවිසුම්ගත වෙලා තියෙන්නෙ මුදල් ලැබුණු දිනයකදී ගෙවනවා කියල ඒ නිසා කලබල වෙන්න ඕන නෑ කියලා. ඉතින් අපි සභාපතිතුමා කියන දේ විශ්වාස කරගෙන හිටියා. නමුත් මේ වෙනකොට ඒ මිනිස්සු නැවත ඉල්ලීම් කරපු නිසා අද සභාවට නැවත මේ යෝජනාව ගෙනල්ලා තියෙනවා.

මමනම් කියන්නෙ මේ වගේ යෝජනාවක් අපි සභාවට දානකොට ලේකම්තුමිය හරහා හෝ අදාළ විෂය හරහා අපි කොපමණ මුදලක වැඩ කටයුතු කරල තියෙනවද?ලක්ෂ ගානකද? කෝටි ගානකද? කියල දැම්මනම් වටිනවා. එතකොට අපට හිතාගන්න පුළුවන් ගන්න මුදල කීයද? අපේ සභාවේ වත්කම්වලින් මේක ගෙවන්න පුළුවන්ද කියලා. එහෙම විනිවිද ජේන විදියකට මේක කළොත් වඩා හොඳයි. ග්‍රාම සේවා වසම් 29 තුළ සංවර්ධන වැඩ මෙපමණ ප්‍රමාණයක් කරල තියෙනවා. ඒ සංවර්ධන වැඩවලට මෙපමණ ප්‍රමාණයක් ගෙවන්න තියෙනවා. කොන්ත්‍රාත්කරුවෝ මෙපමණ ඉන්නවා කියල දැනුවත් කළොත් හොඳයි. මේ මුදල් ගෙවිය යුතුයි කියන තැන අපිත් ඉන්නවා. හැබැයි, මේ ණය ගත්තම අර්බුදයකුත් එනවා. අපි මේ ණය ගත්තම රජයේ මුදල් අපහසුතාවයක් තියෙන නිසා මේ මුදල් අපට නොලැබුණොත් අපි මේ ණය ගෙවන්නෙ කොහොමද? සභාවෙ ගිණුමෙන් ගෙවනවද? සභාවේ වත්කම් වලින් ගෙවනවද? වත්කම් උකස් තියල ගෙවනවද? කියල ගැටලුවක් එනවා. එහෙම නැති වුණොත් අපිට අපේ පරිපාලන කටයුතු ටික කරගන්න බැරිවෙලා සභාව බින්දුවටම වැටේවි. ඒ නිසා ඒකට වැඩපිළිවෙලක් හදල ලබන සභාවට අපට පෙන්වන්න අපි ලක්ෂ කීයක වැඩ කරල තියෙනවද? දැනට කීයක් ලැබිල තියෙනවද? අපි ණය ගන්න හදන්නෙ කීයක්ද කියන එක. ඒ ගැන මන්ත්‍රීවරු දැනුවත් කළානම් හොඳයි.

සංවර්ධන වැඩ කරපු මිනිසුන්ට ගෙවන්න ඕන. දැනුත් පහුවෙලා වැඩියි කියන තැන අපිත් ඉන්නවා. හැබැයි මෙතෙක් කාලයක් මෙහෙම සිදු වුණේ නැහැ. සංවර්ධන වැඩක් කරල මාසයක් දෙකක් තුනක් ඇතුළත අනිවාර්යෙන්ම මුදල් ගෙව්වා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කරන වැඩ වලට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වග කියල ප්‍රාදේශීය ලේකම්තුමා හරහා මුදල් ගෙව්වා. හදිසි කොට්ඨාසවල කිසිදු සංවර්ධන වැඩක් කෙරිල නැහැ. මන්ත්‍රීවරු 10 දෙනා හට කොට්ඨාස වෙන් කරන කොට ඒ 10 දෙනාගෙම කොට්ඨාසවල වැඩ කටයුතු කරලත් නැහැ. ඒ නිසා ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවටත්, මන්ත්‍රීවරුන්ටත් ලොකු ප්‍රශ්නයක් එනවා.
ඒ වගේම දැනට වැඩ කෙරීගෙන ගිහිල්ලා ගමනාගමනය අපහසුවෙලා තියෙන තැන් බොහොමයක් තියෙනවා. කිරිමැටිමුල්ල දකුණ කොට්ඨාසයේ එහෙම ලොකු පැමිණිලි තියෙනවා. මිනිස්සු හත් අට දෙනෙක් දවසකට වැටෙනවා. වාහනයක් ගන්න බෑ. මේවට මොනවද කරන්නෙ කියලත් අපි හොයන්න ඕන. මම දැක්කා අදත් යෝජනාවක් දාලා තියෙනවා සභා අරමුදලින් මාලිම්බඩ කොට්ඨාසයේ විතරක් අඩුපාඩු තියෙන තැන් හදන්න. අර තැන්වල මිනිස්සු යන්න බැරිව වැටෙනවා. කොහොමවත් ගමනාගමනය බෑ. මිනිස්සු වාහන වෙනත් තැනක දාල යන්නෙ. ඒ ගැනත් හොයල බලන්න කියල මම ඉල්ලීමක් කරනවා. මේවට අපි පිළියම් දාන ක්‍රමවේදය කුමක්ද? සභා අරමුදලින් හරි තාර ටිකක් දාල ඒ පාරවල් යන්න පුළුවන් ආකාරයට හදල දෙනවද? එහෙම නැත්නම් මේ ණය ගන්න කොට ඒවත් ප්‍රතිසංස්කරණය කරන්න වැඩපිළිවෙළක් හැදුවොත් හොඳයි කියන තැන මම ඉන්නවා. අපේ සභාවේ මුදල් ටික අපි දැක්කා සාමාන්‍ය මිනිස්සුන්ගෙ දේවල් වලට යොමු වෙනවා. සභාවේ මුදල් තත්ත්වය ක්‍රමයෙන් පහල බැහැල තියෙනවා. ඉදිරියේදි සභාව ගෙනියන්නත් බැරි තැනට එයි. අද ඉන්ධන මිල බැලුවත් වාහනයක් අලුත්වැඩියා කරන්න යන වියදම බැලුවත් විශාල මුදලක් වැය වෙනවා. ඒ වුණාට අපිට ආදායම වැඩි වෙන්නෙ නෑ. ලොකු අපහසුතා එයි. ඒත් අපි සභාව සාර්ථකව ගෙනියන්න ඕන. ඒකට වැඩ පිළිවෙළක් අපට කියන්න කියල සභාපතිතුමාගෙන් ඉල්ලනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

මෙතනදි චෝදනා කිහිපයක් සමග ඉදිරිපත් වූ කරුණුවලට ප්‍රතිචාරයක් දෙන්න ඕන. මාලිම්බඩ කොට්ඨාසයේ සභාපති වශයෙන් ඉන්න නිසා මෙතන යම් අර්බුදයක් ඇති කරන්න දෝ දන්නෙ නෑ මාලිම්බඩ විතරක් වැඩ කළා කියල මතු කිරීමක් කළා. මම තමුන්නාන්සේලාට කරුණාකරල අතීතෙ මතක් කරනවා. මේව පැහැදිලිව ලියල තියෙන්නෙ ගලවපු කැටගල්වලින් පාරවල් සැදීමේ කටයුත්ත කිරීම සඳහා. මේව අපි මාලිම්බඩ කිරීමට පෙර කිරිමැටිමුල්ලෙ කළා. හොරගොඩ කළා. තෙලිජ්ජවිල කරන්න අනුමත කරල තියෙනවා. ඒ එම ප්‍රදේශවල කැටගල් ගලවපුවා. එතකොට තමුන්නාන්සේලා ඇහුවෙ නෑ ඇයි මේවා කිරිමැටිමුල්ලෙ විතරක් කළේ කියල. පොදුවේ අපි තිබ්බව කැටගල් වෙන්දේසි කරන්න හැදුවා සභාවට අරමුදල් ගන්න. වෙන්දේසිය වහාම නතර කරල ගලවපු කැටගල් පාරවල්වල අල්ලන්න කියල විගණනය අපට දැනුම් දීල තිබුණා. ඊට පස්සෙ අපි මොකද කරන්න ඕන. පාරවල්වල ඇල්ලීම තමයි කරන්න තියෙන්නෙ. ඒ නිසා තමයි පාරවල්වල ඇල්ලීමේ කටයුත්ත දාලා තියෙන්නෙ. පන්නිගල පාරත් අපි අනුමත කළා. ඒ නිසා චෝදනාවක් කරන කොට හොඳට හොයල බලල කරන්න. අතීතයේ අපි කැටගල් ගලවපු ප්‍රදේශ වලමයි ඇල්ලුවේ. මේව ගලවල තැන්තැන්වල දාල තියෙනකොට ගෙවල්වලට අරන් යනවා. මේක සභාවට තියෙන වැදගත් දෙයක්. ඒ නිසා වැදගත් විදියට වැඩක් කිරීම තමයි මෙතනදි අපේ අරමුණ තියෙන්නෙ. මට හරි කණගාටුයි එහෙම ප්‍රකාශ කිරීම ගැන. මෙම පාරවල් එක එක කොට්ඨාසවලට වෙන් කරල දීල තියෙන්නෙ. සභාපති හැටියට මම ගනිපු පාරවල් තියෙන්නෙ මගේ කොට්ඨාසයේ විතරයි.
අනෙක් කරුණ තමයි, අපි පාරවල් හැදීම ප්‍රමාද වෙනකොට අපේ කණ්ඩායම කොළඹ ගිහිල්ල සාකච්ඡා කළා. සාකච්ඡාවෙදි කිව්වා පාරවල් ටික හදන්න කියලා. සමහර වෙලාවට ඒ ඒ ප්‍රදේශවල තෝරාගත් කොන්ත්‍රාත්කාරයො ඒ වැඩ ටික කරල තියෙනවා. ඒක සභාවේ තියෙන හැකියාව නොවෙයි. සභාවෙන් ඇතැම් කොට්ඨාසවල කර්මාන්ත නොකළා කියන

චෝදනාව කරන්න එපා. සියලු දෙනාටම පොදුවේ මේවා ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලැබුණා. මේ හැම දෙයක්ම විනිවිද භාවයක් ඇතිව කළා. මගේ දේශපාලන ඉතිහාසය තුළ ගැටලු හංගගෙන කතා කරන ගැටලු හංගන ක්‍රමයක් නැහැ. හැමදෙයක්ම ඕනම කෙනෙකුට ප්‍රශ්න කරන්න පුළුවන් ආකාරයට විනිවිධ භාවයක් ඇතිව කරල තියෙනවා. සභාවක ඉඳල නම කැත කරගෙන යන්න මම වැඩ කරලත් නැහැ. කරන්නෙත් නැහැ. අපි මේ යෝජනාව අනුමත කරල යවමු. මුදල් ගෙවනකොට සාකච්ඡා කරල කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**

පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව ක්‍රියාත්මක කල සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව ක්‍රියාත්මක කළ සංවර්ධන යෝජනා වෙනුවෙන් ගෙවිය යුතු මුදල් අදාළ අමාත්‍යාංශ වලින් ගෙවීමට ප්‍රමාද වන්නේ නම් පසුව ලබා ගැනීමේ පදනම මත කොන්ත්‍රාත් මුදල් කොන්ත්‍රාත් කරුවන්ට ලබා දීම සඳහා දේශීය ණය අරමුදලින් ණයක් ලබා ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:4</u>**

පහ වසර ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් පැවැත්වීමටත් ඒ සඳහා රු.120,000.00 ක පහත වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | වියදම් දරනු ලබන කාරණය | ස්ථානය | දිනය | ප්‍රතිලාභීන් ගණන | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| 01 | ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර කට්ටල 400ක් හා ෆයිල් කවර 400 ක් මුද්‍රනය කිරීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය | 2022 ඔක්තෝබර් | 400 | ප්‍රශ්න පත්‍ර කට්ටල 400ක් සඳහා රු.120 × 400 = **48, 000.00** **ෆයිල් කවර මුද්‍රනය සඳහා** රු.50 × 400 = **20,000.00** |
| 02 | සම්මන්ත්‍රණය සඳහා වන දේශක ගාස්තු පැය 08 ක් සඳහා ගෙවීම් කිරීම | | | | දේශන ගාස්තු රු. 1,500 × 8 = **12,000.00** |
| 03 | වෙනත් වියදම් | | | | **40,000.00** |
| | **එකතුව** | | | | රු**. 120,000.00** |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

අපි සෑම වසරකම ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් කළා. කොරෝනා වසංගතයත් එක්ක ඒක නැවතුණා. නමුත් මේ පවතින අධ්‍යාපන ක්‍රමයේ තිබෙන්නාවූ යම් යම් ප්‍රමාද තත්ත්වය නිසා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් දාන්න කියල මම යෝජනාවක් දැම්මේ.

**ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා**

ඇත්තටම හොඳ යෝජනාවක්. දැනට රටේ තිබෙන තත්ත්වය එක්ක දරුවන්ගෙ අධ්‍යාපනය අඩාල වෙලා තියෙන්නෙ. අපි කොරෝනා වලින් බැටකාපු ජාතියක්. ඒ අතරෙ පාසල් වසා තැබීමත් සමග අද දරුවන්ගෙ අධ්‍යාපන කටයුතු අඩාල වෙලා. මේ වෙනකොට නිවසේ සිට මාර්ගගත ක්‍රමයට ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක වුණත් ඒවා සාර්ථක නෑ කියල තමයි මම නම් හිතන්නෙ. සමහර වෙලාවට සිග්නල් නෑ. ඇහෙන්නෑ. බරපතල ප්‍රශ්නවලට දරුවෝ මුහුණ දෙනවා. මම කියන්නෙ මේ සම්මන්ත්‍රණය හොඳ ගුරුවරයෙක් තෝරගෙන ශිෂ්‍යත්ව විභාගය අරමුණු කරගෙන පවත්වනව නම් හොඳයි. දැනට තියෙන ගැටලුත් එක්ක අපේ අනාගතය භාරගන්න ඉන්න දරුවෝ දැඩි පීඩනයකට පත්වෙලා තියෙනවා. මීට අමතරව අපිට පුළුවන්නම් මොනවහරි පන්ති ටිකක් පවත්වන්න. ඒ ගැනත් සොයල බලන්න කියල මම යෝජනා කරනවා.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

අපි කොරෝනා කාලයේ Zoom තාක්ෂණය ඔස්සේ ගුරුවරුන් සම්බන්ධ කර ගත්තා. ප්‍රධාන ලේකම් දක්වා සියලු දෙනා අනුමත කරා ගුරු වැටුප් ගෙවන්න. හැබැයි ආණ්ඩුකාරතුමා අනුමත කළේ නෑ. ගුරුවරු ටික Zoom තාක්ෂණය ඔස්සේ පන්ති කරන්න යම් කැප කිරීමක් කරා. ඒ අයට සත පහක්වත් ගෙව්වෙ නෑ. එයාල මුදල් බලාපොරොත්තු වුණේ නෑ.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:4**

පහ වසර ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් පැවැත්වීමටත් ඒ සඳහා රු. 120,000.00 ක පහත වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත් තීරණය විය.

| අනු අංකය | වියදම් දරනු ලබන කාරණය | ස්ථානය | දිනය | ප්‍රතිලාභීන් ගණන | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| 01 | ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර කට්ටල 400ක් හා ෆයිල් කවර 400 ක් මුද්‍රනය කිරීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය | 2022 ඔක්තෝබර් | 400 | ප්‍රශ්න පත්‍ර කට්ටල 400ක් සඳහා රු.120 × 400 = **48, 000.00** **ෆයිල් කවර මුද්‍රනය සඳහා** රු.50 × 400 = **20,000.00** |
| 02 | සම්මන්ත්‍රණය සඳහා වන දේශක ගාස්තු පැය 08 ක් සඳහා ගෙවීම් කිරීම | | | | දේශන ගාස්තු රු. 1,500 × 8 = **12,000.00** |
| 03 | වෙනත් වියදම් | | | | **40,000.00** |
| | **එකතුව** | | | | රු. **120,000.00** |

**<u>යෝජනා අංක 5:5</u>**

සතියේ වැඩ කරන දින හතරකට හෝ ඊට වැඩියෙන් සේවයට වාර්තා කරන නිලධාරීන්ට හා සේවකයින් සඳහා සභා කාර්යාලයට පැමිණීමට හා පිටවීමට සේවා ස්ථාන වලට යාම සඳහාත් සහා අරමුදල් වලින් ණය පදනම මත පා පැදියක් අදාල නිලධාරීන්ට හා සේවකයින්ට ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඉදිරි සභා වාරයට කල් තබන ලදී.

**<u>යෝජනා අංක 5:6</u>**

නාමල් මාවතේ ඉතිරි කොටස (මීටර් 15 ක් පමණ) ජනතා සහභාගීත්වයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති කළු ගල් වැලි සැපයීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:6</u>**

නාමල් මාවතේ ඉතිරි කොටස (මීටර් 15 ක් පමණ) ජනතා සහභාගීත්වයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති කළු ගල් වැලි සැපයීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:7</u>**

ගලවා ඉවත් කරන ලද කැට ගල් පහත සඳහන් මාර්ග වලට ඇතිරීමට ගරු සභාවට යෝජනා කරමි.

- අරලිය මාවත හරස් මාර්ගය
- වෙල්ලගාවවත්ත රාජ මහතාගේ නිවස අසල සිට අයි.ජී.නාලක ප්‍රදීප් මහතාගේ නිවස දක්වා මාර්ගය

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:7</u>**

ගලවා ඉවත් කරන ලද කැට ගල් පහත සඳහන් මාර්ග වලට ඇතිරීමට තීරණය විය.

- අරලිය මාවත හරස් මාර්ගය
- වෙල්ලගාවවත්ත රාජ මහතාගේ නිවස අසල සිට අයි.ජී.නාලක ප්‍රදීප් මහතාගේ නිවස දක්වා මාර්ගය

**<u>යෝජනා අංක 5:8</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලය තුළ නිලධාරීන් විශාල වශයෙන් සිටින නිසාත්, ආයතනයේ ඉඩකඩ නොමැති නිසාත්, තෙලිජ්ජවිල මහජන පුස්තකාලයේ පහල මාලය තුළ ප්‍රාදේශීය සභා උපකාර්යාලයක් පවත්වන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:8</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලය තුළ නිලධාරීන් විශාල වශයෙන් සිටින නිසාත්, ආයතනයේ ඉඩකඩ නොමැති නිසාත්, තෙලිජ්ජවිල මහජන පුස්තකාලයේ පහල මාලය තුළ ප්‍රාදේශීය සභා උපකාර්යාලයක් පැවැත්වීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:9</u>**

අස්වැන්නේ අඩුවක් පවතින අර්බුදකාරී තත්ත්වයක් පවතින කාලය තුළ ගොවීන් ධෛර්යමත් කරලීම සඳහා සභා අරමුදලින් බීජ ඉසින යන්ත්‍ර (සීඩර්) 29 ක් සහ බැද්ද නෙලන (වීඩර්) යන්ත්‍ර 29 ක් ලබා ගෙන ග්‍රාම නිලධාරී වසම් 29 ක් සඳහා ප්‍රජා මණ්ඩල වලට හෝ ගොවිසමිති වලට ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

2022/06/15 මාසික සභාව සඳහා ඉදිරිපත් කර කල්තබන ලද ඉහත යෝජනාව ජනතාවගේ ඉල්ලීම මත පහත පරිදි සංශෝධනය කරමි.
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ අරමුදල් තත්ත්වය සලකා ප්‍රමුඛතා ලේඛනය අනුව පහත සඳහන් උපකරණ හා ද්‍රව්‍ය ප්‍රජා මණ්ඩලවලට හෝ ගොවි සමිති වලට ලබා දීමට යෝජනා කරමි.

- වල් පැළ නෙළීමේ යන්ත්‍ර
- පැළ සිටුවීමේ යන්ත්‍ර
- තණකොළ කපන යන්ත්‍ර
- තෙල් ඉසීමේ යන්ත්‍ර
- ඇලවල් සුද්ද කිරීම සඳහා ඉන්ධන

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:9</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ අරමුදල් තත්ත්වය සලකා ප්‍රමුඛතා ලේඛනය අනුව පහත සඳහන් උපකරණ හා ද්‍රව්‍ය ප්‍රජා මණ්ඩලවලට හෝ ගොවි සමිති වලට ලබා දීමට තීරණය විය

- වල් පැළ නෙළීමේ යන්ත්‍ර
- පැළ සිටුවීමේ යන්ත්‍ර
- තණකොළ කපන යන්ත්‍ර
- තෙල් ඉසීමේ යන්ත්‍ර
- ඇලවල් සුද්ද කිරීම සඳහා ඉන්ධන

**<u>ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා</u>**

සභාපතිතුමා, ගොවි සංවිධානවලට උපකරණ ලබාදීම සම්බන්ධ යෝජනාව ගැන කතා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මමත් ගොවි සංවිධානයක වසර ගණනාවක් තිස්සේ කටයුතු කරපු නිසා ඒ පළපුරුද්දත් එක්ක අපි අත් විඳපු අත් දැකපු කාරණා එක්ක තමයි මම කතා කරන්නෙ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් 50% ප්‍රතිලාභ ලබා දීමේ වැඩසටහනක් වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වෙනවා. ඒ යටතේ ගොවීන්ට අවශ්‍ය සීඩර් , වීඩර්, තෙල් ඉසින යන්ත්‍ර සහ වී වේලන යන්ත්‍ර ලබා දීමේ විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක වෙනවා. ඒක සාර්ථකයි කියනඑක මම දැකලා තියෙනවා. මොකද ගොවීන්ගෙනුත් දායකත්වයක් දීල තමයි තමන්ට අවශ්‍ය උපකරණ ගන්නෙ. එතකොට ඒ උපකරණ ලබා ගන්න පුද්ගලයට හැඟීමක් එනවා ඒක මගේය කියලා. ඒ උපකරණ එයා හොඳින් ආරක්ෂා කරනවා.

මම ගොවිජන සේවා කාරක සභාවේ අවුරුදු 10ක් ඉඳල තියෙනවා. නොයෙක් නොයෙක් වසර වල තෙල් ටැංකි දීල ඇති 100 කට වැඩිය. අද තොරතුරු ගත්තම ක්‍රියාත්මක වන මට්ටමේ තෙල් ටැංකි තියෙන්නෙ ඉතා සුළු සමිති ප්‍රමාණයක විතරයි. ඒකත් ඒ නිලධාරීන්ගෙ හොඳකම මත තමයි. තෙලිජ්ජවිල ගොවි සංවිධානයට මේ වෙනකොට සීඩරයකුයි වීඩරයකුයි දීල තියෙනවා. එතන පරිපාලනයේ හොඳ කමට ඒක හොඳට ක්‍රියාත්මක වෙනවා. අල්ලපු වසම්වලටත් දෙනවා. මම කරුණු සොයල බැලුවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ගොවි සංවිධානවලට දීපු සීඩරේකුයි වීඩරේකුයි විකුණලත් තියෙනවා. එකක් තමයි පසුවිපරමක් නැතිකම. දැන් අපි සභාවෙන් මේ වැඩසටහන ක්‍රියාත්මක කළත් හොඳ පසුවිපරමක් කළොත් අපට මේ බඩුටික ආරක්ෂා කරගන්න පුලුවන් වෙයි. නැතිනම් බැරිවෙයි. ඒ වගේම මේ කොට්ඨාස 29 ගත්තම මේ 29 ටම බීජ ඉසින යන්ත්‍ර ගැළපෙන්නෑ .ඒ යන්ත්‍රයෙත් තියෙනවා ප්‍රභේද කිහිපයක්. පසේ ඇල් ගතියට ගැළපෙන ආකාරයට තමයි මැෂින් තෝරගන්න ඕන. අන්න ඒ වගේ දෙයක් හොඳ ගැළපෙන පුද්ගලයෙකුට දුන්නොත් ඒවා ආරක්ෂා කරගනීවි.

අපි අවුරුදු 10 ක විතර පටන් අපේ ගොවි සංවිධානයට මිනිසුන්ට අවශ්‍ය වන කිරි කප් එකේ ඉඳල ටකරන් මඩුව දක්වා අවශ්‍ය බඩු ටික හැදුවා. හදල ඊළඟ සමිති නිලධාරීන්ට භාර දුන්නා. අද වෙනකොට කිසිම බඩුවක් කිසිම කෙනෙකුට දෙන්නෙ නෑ. අපිටවත් ගන්න විදියක් නැතිවෙලා තියෙනවා. අද වෙනකොට ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඒ තත්ත්වයට පත්වෙලා තියෙනවා. ගොවිජන සේවා මධ්‍යස්ථානවල පසු විපරම බින්දුවයි. කිසිම සමිතියක දෙයක් ගැන සොයා බලන්නෙ නෑ.මේ භාණ්ඩ ලබා දෙනවනම් සමිතියකට දෙන්නෙ නැතිව ඉලක්කගත පුද්ගලයෙකුගේ පරිහරණයට භාර කරල ලබා දෙන්න කියල ඉල්ලනවා.අපේ මුදලුත් අවසන් වෙලා සභාවේ අරමුණ ඉටුකරගන්නත් බැරිව ප්‍රයෝජනයකුත් නැතිව ගෞරවයකුත් නොලැබී ගියොත් ලොකු හානියක් වෙනවා. ඒ නිසා සභාපතිතුමා මේ ගැන තව ටිකක් සොයල බලල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මේ පිළිබඳව ඉන්න නිලධාරීන්ගෙනුත් මොන මොන සමිතිවලට දැනට බඩු දීල තියේද කියල විස්තර ලබා ගන්න. ඒ නිසා මේ ගැන නැවත අධ්‍යනයක් කරල ගොවීන්ට සහනයක් හැටියට ක්‍රියාත්මක කරනවනම් හොඳයි කියල ප්‍රකාශ කරනවා.

**<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>**

මම දැන් අවුරුදු 13 ක් තිස්සේ ඉඳල කද්දුව ගොවි සංවිධානයේ සභාපති වශයෙන් කටයුතු කරනවා. අපේ සමිතියේ තෙල් ටැංකි 4ක් තියෙනවා. 180,000.00ක ඔරු 2ක් තියෙනවා. තණකොළ කපන යන්ත්‍ර තියෙනවා. ඇත්තටම අපි ගොවි සංවිධානයේ ගොවීන්ට රු.20.00ක රිසිට්පතක් නිකුත් කරල මේ උපකරණ ලබා දෙනවා. අද කුලියට තෙල් ටැංකියක් ගහන්න රු.250.00 ක කුලියක් ගන්නවා. අපේ ගොවි සංවිධානයෙන් අපි ඒ උපකරණ නඩත්තු කරනවා. ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අපේ ළඟ මේ භාණ්ඩ තියෙනවද කියල හැම අවුරුද්දෙම පරීක්ෂණයක් පවත්වනවා. මේවා ගොවි සංවිධානවල පෙර නිලධාරීන්, අපට භාර දීපුවා. අදටත් තාම තියෙනවා. ගොවි සංවිධානවල සභාපති, ලේකම්,

භාණ්ඩාගාරික ගිහින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අත්සන් කරල තමයි ඒ උපකරණ භාර ගත්තෙ. නැවත ඒ භාණ්ඩ ඊළඟ නිලවරණයෙන් පත්වන අයට භාර දෙන්න ඕන. එහෙම හොරා කන්න බෑ ගොවි සමිතිවල භාණ්ඩ. ඒ නිසා සභාපතිතුමනි, මේ ලබා දෙන දේවල් ගොවි සමිතිවලට දෙන්න.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

මම දන්නවා පුද්ගලිකව බඩු භාර දීපුවා ගෙවල්වල තියෙනවා. මේක අවට තියෙනවා පැළ සිටුවීම සඳහා රජයෙන් ගොවියන්ට බෙදන්න කියල නොමිලේ දීපු මැෂින්. පනහට පනහක් දෙන්න කිව්වට එහෙම දීල නෑ. ඒක භාර ගනිපු ගොවි මහත්තය ඒක තියාගෙන කුළියට දෙනවා. කිසිම තැනකට සත පහක්වත් අඩු කරන්නෙත් නෑ. ඒ නිසා පුද්ගලයෙකුට දෙන එකේ සාර්ථකත්වයක් නෑ. පුද්ගලයෙකුට දුන්නට පස්සෙ වගකීමකුත් නෑ. අපිට කොට්ඨාස භාර නිලධාරියෙක් ඉන්නවා. අපි බලාපොරොත්තු වෙන්නෙ අපේ ප්‍රජා මණ්ඩලවලට මේ බඩු ටික භාර දෙන්න. වගකීමට කොට්ඨාස භාර නිලධාරියෙක් ඉනනවා. කොට්ඨාස භාර නිලධාරීන් ප්‍රජා මණ්ඩලය හා සම්බන්ධ වෙලා අවශ්‍ය ගොවීන්ට ඒ යන්ත්‍ර භාර දෙනවා. එහෙම නැතිව මේක දෙන්න ගියොත් අපේ අනන්‍යතාව නැතිවෙනවා. ප්‍රජා මණ්ඩලයකට දුන්නොත් අපිට අධීක්ෂණය කරන්න පුලුවන්.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**<u>යෝජනා අංක 6:1</u>**

හොරගොඩ පොල්පිටිය එකමුතු මාවත කාපට් කිරීමේ ව්‍යාපෘතිය අතරමග නතරවීමෙන් පසු ඇති වූ අධික වර්ෂාවට මාර්ගය දෙපස පස් කඳු කඩා වැටීමෙන් ඇති වී ඇති අවහිරතා එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා ඉවත් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය සාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:1</u>**

හොරගොඩ පොල්පිටිය එකමුතු මාවත කාපට් කිරීමේ ව්‍යාපෘතිය අතරමග නතරවීමෙන් පසු ඇති වූ අධික වර්ෂාවට මාර්ගය දෙපස පස් කඳු කඩා වැටීමෙන් ඇති වී ඇති අවහිරතා එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා ඉවත් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:2</u>**

ඇල්ගිරිය හා හොරගොඩ වසම්වල ජනතාව සඳහා තොග ජලය ලබා ගැනීමට ලීටර් 40,000 ක් පිරවිය හැකි ජල ටැංකි ඇල්ගිරිය එකමුතු ප්‍රජා මූල සංවිධානය වෙත ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

**<u>ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා</u>**

ඇල්ගිරිය හා හොරගොඩ නැගෙනහිර වසම්වල පවුල් 180 කට පමණ ජලය ලබා දෙනවා.එම ජලය අධික කිවුල් ගතිය නිසා පානය කිරීමට සුදුසු නැහැ. ඒත් ජලය නොමැතිකම නිසා අසරණ ජනතාව එම ජලය පානය කරනවා. ජල සම්පාදන මණ්ඩලයෙන් පානීය ජලය ලබා ගැනීමට සැලසුම් කරල තියෙනවා. තොග ජලය ලබා ගැනීම සඳහා ටැංකි නොමැතිකම ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ඒ නිසා ලීටර් 40,000 ක් පිරවිය හැකි ජල ටැංකි ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:2</u>**
ඇල්ගිරිය හා හොරගොඩ වසම්වල ජනතාව සඳහා තොග ජලය ලබා ගැනීමට ලීටර් 10,000 ක් පිරවිය හැකි ජල ටැංකි 2ක් ඇල්ගිරිය එකමුතු ප්‍රජා මූල සංවිධානය වෙත ලබා දීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:3</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා ලබාගත් පාපැදි බලපත්‍ර තහඩු අවසන් වී ඇති බැවින් නව තහඩු මුද්‍රණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
බයිසිකල් ලියාපදිංචි කරන්න දැන් ගොඩක් මිනිස්සු එනවා. දැනට අපි ළඟ තියෙන තහඩු අවසන් වෙලා තියෙන්නෙ. දැනට අපි මේ සඳහා අය කරන ගාස්තුව රු.20.00යි. නමුත් අපිට තහඩුවක් හදන්න රු.100.00ක පමණ පිරිවැයක් දරන්න වෙනවා.

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**

ලදුපත් නිකුත් කරන්නත් වෙනවනේ ඒ නිසා ගාස්තුව රු.200.00ක් කරන්න.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා ලබාගත් පාපැදි බලපත්‍ර තහඩු අවසන් වී ඇති බැවින් නව තහඩු මුද්‍රණය කිරීමටත් එක් බලපත්‍රයක් වෙනුවෙන් අයකරන ගාස්තුව රු.200.00ක් දක්වා වැඩි කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:4</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| ජී.බී.චන්ද්‍රසිරි මයා,<br>යසිත, ගල් ඇන්දකුට්ටිය,තෙලිජ්ජවිල | දෙමහල් නිවස මායිම් පැතිබැම්ම |
| ඩී.එල් උපුල් මයා,කෝට්ටවත්ත,<br>කිරිමැටිමුල්ල. | කොන්ක්‍රීට් කණු යොදා වහල ඉදිකිරීම |
| නිහාල් හෙට්ටිආරච්චි,ගයනි නිවස,<br>කිරිමැටිමුල්ල. | අනවසර ගොඩනැගිල්ල ඉදිකිරීම |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
විගණනයට ලක්වී ඇති අනවසර ඉදිකිරීම් තමයි මේ ඉදිරිපත් කරල තියෙන්නෙ.

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**
නඩු පවරන්න යද්දි අපට ප්‍රශ්න එන්නෙ නැතිවෙන්න නීත්‍යානුකූලව දැනුම්දීම් කරන ලද පැහැදිලිව ලිපිලේඛන සකස් කරපු ඒව නම් නඩු පවරමු. එහෙම නැත්නම් කල් අරගෙන ලිපි ලේඛන සකස් කරගමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින ලිපිලේඛන සම්පූර්ණ කරන ලද අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 6:5</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන සැලසුම් කමිටු දීමනාව රු.1000.00 සිට රු.2000.00ක් දක්වා වැඩි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**
ඇප්ලිකේෂන් 10 ක් සඳහා එක් කමිටුවක් බැගින් රැස් කරන්න.කමිටු දීමනාව ගෙවනකොට අපි ප්‍රශ්න කරනවා ඇප්ලිකේෂන් කීයක් ආවද කියලා. ඇප්ලිකේෂන් අනුමත කරගන්න හදිසි අය ඉන්නව නම් එයාලට දැනුම් දෙන්න සභාවේ මුදල් ප්‍රශ්නයක් තියෙන නිසා කමිටුව නිතර රැස් කරන්නෑ. කමිටුව රැස් වුණොත් දිනකට මේ වගේ ගාස්තුවක් කමිටු සාමාජිකයන්ට ගෙවන්න වෙනවා. ඒ නිසා කමිටු දීමනාව වෙනුවෙන් යන පිරිවැය අදාළ පුද්ගලයට දරන්න පුලුවන් නම් ඇප්ලිකේෂන් එකක් තිබුණොත් අනුමත කරන්න අපි යෝජනාවක් දාමු
ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන සැලසුම් කමිටු දීමනාව රු.1000.00 සිට රු.2000.00ක් දක්වා වැඩි කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

ඉන්ධන මිළ සීඝ්‍ර ලෙස ඉහලයාම හේතුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමේදී පැයක් සඳහා අයකරන ගාස්තුව රු.5200.00 සිට රු.6000.00දක්වා වැඩි කිරීමටත්, ජේ.සී.බී. යන්ත්‍රය වෙන් කරන කාලය පැය 04 කට අඩුනම් සහ දුර ප්‍රමාණය 5km වැඩිනම් ගමන ආරම්භ කළ ස්ථානයේ සිට මීටරය ගණනය කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
දැන් ඉන්ධන මිලේ හැටියට රු.6000.00ක් වත් පැයකට අය කරන්න වෙනවා. වාහන කොටස්වලත් මිළ අධිකයි. ඒ නිසා පැයකට රු.6000.00ක් අය කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

ඉන්ධන මිළ සීඝ්‍ර ලෙස ඉහලයාම හේතුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමේදී පැයක් සඳහා අයකරන ගාස්තුව රු.5200.00 සිට රු.6000.00 දක්වා වැඩි කිරීමටත්, ජේ.සී.බී. යන්ත්‍රය වෙන් කරන කාලය පැය 04 කට අඩුනම් සහ දුර ප්‍රමාණය 5km වැඩිනම් ගමන ආරම්භ කළ ස්ථානයේ සිට මීටරය ගණනය කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:7</u>**

**<u>ප්‍රාදේශීය සභා රැස්වීම් කාර්යය පටිපාටියේ 11(5) අනුව 2022/03/08 වන දින පැවති මහා සභාවේ අංක 6.4 යෝජනාව පරිච්ඡින්න කිරීම සඳහා වූ පහත සඳහන් යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඇතුළු ගරු උප සභාපති,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත මුණසිංහ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නාලක යන සභිකයින් හතර දෙනාගේ අත්සන් සහිතව ඉදිරිපත් කිරීම.</u>**

සැනසුම, දානපතිවත්ත, අකුරුගොඩ, සුල්තානාගොඩ යන ලිපිනයෙහි පදිංචි ජී.සුසන්ත මනෝජ් යන අය හදිසි අනතුරකට ලක්ව රෝගාතුරව සිටින බැවින්, බදු ගිවිසුමක් යටතේ ඔහු වෙත ලබා දී තිබූ මාලිම්බඩ නව කඩ සංකීර්ණයේ කඩ කාමර අංක 31 සඳහා පවතින රු.76650.00 ක හිඟ කඩකුළී මුදල ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නිදහස් කිරීමට ගරු සභාවට යෝජනා කරමු.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**

ටෙන්ඩර් පදනම මත ලබාගෙන ඇති මෙම කඩ කාමරයේ එක්වන් මුදල එකවර ගෙවා අවසන් කර ඇති නිසාත්, මොහු මේ වනවිටත් රෝගාතුරව සිටින නිසාත්, කඩ කාමරයේ යතුරු සභාව වෙත නැවත භාරදුන් 2022/01/18 දින තෙක් පවතින රු.76650.00 හිඟ කඩකුළී මුදල ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:8</u>**

වැලිගම ප්‍රාදේශීය සභාව විසින් එවන ලද වයිබ්‍රේටින් රෝලර් යන්ත්‍රය සුහද හුවමාරුව සම්බන්ධ ලිපිය අනුව එම හුවමාරුව සඳහා වැලිගම ප්‍රාදේශීය සභාවේ කැමැත්ත ලැබී ඇත. එම යන්ත්‍රය වෙනුවට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව ලබා දෙන වාහනය කුමක්ද යන්න දැනුම් දීමෙන් පසු තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රි දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:8</u>**

හුවමාරුවට පෙර වැලිගම ප්‍රාදේශීය සභාවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට පැමිණ වයිබ්‍රේටින් රෝලර් යන්ත්‍රය පරීක්ෂා කර බලා, වැලිගම ප්‍රාදේශීය සභාව ලබා දීමට අපේක්ෂා කරන වාහනය කුමක්ද යන්න විමසා එයින් ලද පිළිතුර ඉදිරි සභාවකට යොමු කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:9</u>**

මාරගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් පාරෙවත්ත මාර්ගයේ සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති 15m පමණ ප්‍රමාණයත්, කැකුණවෙල බැද්දහේන මාර්ගයේ අධික සෝදා පාළුවට ලක්වන 110m පමණ ප්‍රමාණයත් සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:9</u>**

මාරගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් පාරෙවත්ත මාර්ගයේ සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති 15m පමණ ප්‍රමාණයත්, කැකුණවෙල බැද්දහේන මාර්ගයේ අධික සෝදා පාළුවට ලක්වන 110m පමණ ප්‍රමාණයත් සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 6:10</u>**

දම්පැල්ල කොට්ඨාසයේ පහත සඳහන් මාර්ග සඳහා හියුම් පයිප්ප මිලදී ගෙන යෙදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- කැකුණවෙල උඩුමුල්ල හේන මාර්ගයේ ස්ථාන දෙකක් සඳහා දිග 6' -0"ක් සහ විෂ්කම්භය 01' -0"හියුම් පයිප්ප 04ක් යෙදීම.
-දම්පැල්ල කැකුණවෙල මාර්ගයේ දම්පැල්ල මහා විද්‍යාලය දිග 6' -0"ක් සහ විෂ්කම්භය 02' -0"හියුම් පයිප්ප 04ක් යෙදීම.
-කැකුණවෙල ඉහලහවත්ත මාර්ගයට හා බැද්දහේන මාර්ගයට දිග 6' -0"ක් සහ විෂ්කම්භය අඩි 1 1/2 ක් වූ හියුම් පයිප්ප 06ක් යෙදීම.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:10</u>**

දම්පැල්ල කොට්ඨාසයේ පහත සඳහන් මාර්ග සඳහා හියුම් පයිප්ප මිලදී ගෙන යෙදීම සුදුසු බවට තීරණය විය.

- කැකුණවෙල උඩුමුල්ල හේන මාර්ගයේ ස්ථාන දෙකක් සඳහා දිග 6' -0"ක් සහ විෂ්කම්භය 01' -0"හියුම් පයිප්ප 04ක් යෙදීම.
-දම්පැල්ල කැකුණවෙල මාර්ගයේ දම්පැල්ල මහා විද්‍යාලය දිග 6' -0"ක් සහ විෂ්කම්භය 02' -0"හියුම් පයිප්ප 04ක් යෙදීම.
-කැකුණවෙල ඉහලහවත්ත මාර්ගයට හා බැද්දහේන මාර්ගයට දිග 6' -0"ක් සහ විෂ්කම්භය අඩි 1 1/2 ක් වූ හියුම් පයිප්ප 06ක් යෙදීම.

**<u>යෝජනා අංක 6:11</u>**

තෙලිජ්ජවිල කොට්ඨාසයේ කඩුකන්න ග්‍රාම නිලධාරී වසමෙහි කඩුකන්න බෝධිය අසලින් දිවෙන එගොඩවත්ත නමින් නම් කර ඇති මාර්ගය බුද්ධ ජයන්ති මාවත ලෙස නම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:11</u>**

තෙලිජ්ජවිල කොට්ඨාසයේ කඩුකන්න ග්‍රාම නිලධාරී වසමෙහි කඩුකන්න බෝධිය අසලින් දිවෙන එගොඩවත්ත නමින් නම් කර ඇති මාර්ගය බුද්ධ ජයන්ති මාවත ලෙස නම් කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 6:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කෘෂි ඒකකය මගින් ක්‍රියාත්මක කරන "කෘෂිරසායනික ද්‍රව්‍ය වලින් තොර කාබනික පෝෂක මගින් නිවසට තිරසර ගෙවතු වගාවක්" ව්‍යාපෘතියේ II වන අදියර යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 400 -5000 දක්වා වැඩි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කෘෂි ඒකකය මගින් ක්‍රියාත්මක කරන "කෘෂිරසායනික ද්‍රව්‍ය වලින් තොර කාබනික පෝෂක මගින් නිවසට තිරසර ගෙවතු වගාවක්" ව්‍යාපෘතියේ II වන අදියර යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 400 -5000 දක්වා වැඩි කිරීමටත්, එහිදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කොට්ඨාසයේ ජනතාවට ලබා දීම සඳහා මන්ත්‍රීවරුන් හට බීජ පැකට් ලබා දීමටත් තීරණය විය

**<u>යෝජනා අංක 6:13</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කෘෂි ඒකකය මගින් ක්‍රියාත්මක කරන " කෘෂිරසායනික ද්‍රව්‍ය වලින් තොර කාබනික පෝෂක මගින් නිවසට තිරසර ගෙවතු වගාවක්" ව්‍යාපෘතියේ III වන අදියර යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2500 දක්වා වැඩි කිරීමටත් ඇස්තමේන්තු ගත මුදල රුපියල් ලක්ෂ විසිපහ දක්වා වැඩි කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:13</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කෘෂි ඒකකය මගින් ක්‍රියාත්මක කරන " කෘෂිරසායනික ද්‍රව්‍ය වලින් තොර කාබනික පෝෂක මගින් නිවසට තිරසර ගෙවතු වගාවක්" ව්‍යාපෘතියේ III වන අදියර යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2500 දක්වා වැඩි කිරීමටත් ඇස්තමේන්තු ගත මුදල රුපියල් ලක්ෂ විසිපහ දක්වා වැඩි කිරීමටත් තීරණය විය

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

2022/06/15 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/06/28 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/07/07 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9). වෙනත් කරුණු.**

**<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>**
ගරු සභාපතිතුමනි, කිරිමැටිමුල්ල උතුර ග්‍රාම නිලධාරී වසමේ කැරැන්තොල්ල හා වල්පිට දක්වා දිවෙන බෝපගොඩ මාර්ගය කෘෂි මාර්ගයක්. ඒ මාර්ගයේ ඉහළ කොටස ගොවීන් විසින් කපාගෙන ගිහිල්ලා. අඩි 10 ක පමණ පළලට තිබුණු පාරක් දැන් අඩි 6ක් පමණ වෙලා තියෙනවා. ඒ මාර්ගය විශාල වශයෙන් කද්දුව පාරට යන පිරිස් සහ වල්පිට හරහා තෙලිජ්ජවිල යන පිරිස් භාවිතා කරපු මාර්ගයක්. ඒ මාර්ගය නාපෙ වැවෙන් එන වතුර පාර ගලන් යන රක්ෂිත මාර්ගයක් ලෙස පැවතුණා. මේ සඳහා මැදිහත් වීමට අපිට බලයක් නැතත් අපි සභාව හරහා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට, ප්‍රාදේශීය ලේකම්තුමාට ලියුමක් යවමු. ඒ වගේම ගොවිජන සේවා නිලධාරීතුමියත් දැනුවත් කරන්න කියල ඉල්ලීමක් කරනවා.

**<u>ගරු මන්ත්‍රී රවිත මොහොට්ටි මහතා</u>**
සභාපතිතුමා මගේ කොට්ඨාසයේ ඉඩමක් බිම් සකස් කරල වෙන්දේසිය සඳහා සියලු කටයුතු සූදානම් කරල තියෙනවා. බිම් සකස් කිරීම සඳහා සභාවෙන් අනුමැතියක් හෝ අවසරයක් ලබා ගෙන තියෙනවද කියල දැනගන්න කැමතියි.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
අපෙන් අනුමැතියක් අරගෙන නෑ.

**<u>ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය</u>**
ගරු සභාපතිතුමනි, දම්පැල්ල කැකුණවෙල මාර්ගය පහුගිය වැසි කාලය නිසා කැලෑවෙලා. සමහර ඉඩම් හිමියන් පාරට අවහිරයක් නොවෙන්න තම තමන්ගෙ ඉඩම් සුද්ධ කර ගන්නවා. නමුත් ඇතැම් ඉඩම් හිමියන්ගෙ ඉඩම්වල තියෙන ගස් අතුත් පාරට නැමිල පාරෙ තියෙන තණකොළත් වැවිල දම්පැල්ල කැකුණවෙල මාර්ගය භාවිතා කරන අය ලොකු අපහසුතාවයකට පත් වෙනවා.පළම මාර්ගය සංවර්ධන කටයුත්තක් සඳහා තණකොළ කපල සුද්ද පවිත්‍ර කරල දෙන්න කියල සභාපතිතුමාගෙන් ඉල්ලනවා.

ඒ වගේම කැකුණවෙල ගබඩවත්තට යන පාර සම්පූර්ණ කිරීම මෙතෙක් සාකච්ඡාවට ඇවිත් නැහැ.ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගන්න කියල මම ඉල්ලනවා.

**<u>ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය</u>**
දම්පැල්ල කැකුණවෙල මාර්ගය සභාවෙන් නඩත්තු කරනවා.වාර කිහිපයකදී තණකොළ කපල පිරිසිදු කළා.පහුගිය සතියෙ ඉරිදා ග්‍රාම සංවර්ධන සමිතියේ ශ්‍රම දානයක් මගින් ලොකු වැඩ කොටසක් කළා. ඒ නිසා ලොකුවටම තණකොළ පැතිරීමක් සිදුවෙලා නෑ.ඒකෙ නඩත්තු කටයුතු නිතරම සභාව මගින් සිදු කරනවා.මේ දිනවල ඉන්ධන අර්බුදය නිසා තමයි යම්තාක් දුරට ගැටලුවක් ඇති වෙලා තියෙන්නෙ.

**<u>ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර</u>**
මේ මොහොත වනවිට මාලිම්බඩ කොට්ඨාසය මාතර දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ජාතික ජල සම්පාදන මණ්ඩලයේ නව ජල නල එලීම් කටයුතු සිදුවෙමින් පවතිනවා. මාතර දිස්ත්‍රික්කයේ අපට ආවේනික කොන්ත්‍රාත් සමාගම් 7ක් විසින් එහි කොන්ත්‍රාත් කටයුතු භාර අරගෙන තියෙනවා. මාලිම්බඩටත් බලපාන කොන්ත්‍රාත් සමාගම් 2ක් තියෙනවා. ඒ කොන්ත්‍රාත් සමාගම් 2න් එකකින් පමණක් මේ මොහොත වනවිට වැඩ කටයුතු සිදු කරමින් පවතිනවා. අපි ඒ වැඩකටයුතු කරගෙන යන බ්‍රවුන් සමාගමට ස්තුතිවන්ත වෙනවා. හැබැයි බ්‍රවුන් සමාගම වැඩ කටයුතු කරගෙන යද්දි ඒ අය ලොකු අර්බුදයකට මුහුණ පාමින් සිටිනවා.

අර්බුදය තමයි මාර්ග සංවර්ධන අධිකාරියෙන් නිදහස් කරගත යුතු මාර්ග මේ මොහොත වනවිට නිදහස් නොකිරීම. ඒ නිදහස් නොකිරීම මත දැන් මාර්ග කිහිපයකටම බට නල යොදා ඇතත් ජලය ලබා දෙන්න පුලුවන් කමක් නෑ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් නම්‍යශීලී වෙලා ඒ ආයතනත් එක්ක කතා කරලා අපේ සභාපතිතුමා ඒ ආයතනත් එක්ක සම්බන්ධ වෙලා මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ අවශ්‍ය මාර්ග නිදහස් කිරීම ලබා දෙන්න පුලුවන්කම ලැබුණාත්, මාලිම්බඩ කොට්ඨාසයේ බහුතරයක් කඩුකන්න මංසන්ධියේ සිට හේනෙගම දක්වාත්, හොරගොඩ ඉපොල්ඔළුව මංසන්ධියේ සිට වැල්ලාන දක්වාත්, තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාල මාර්ගය, දම්පැල්ල මාර්ගය ආදී පළාත් මාර්ග කිහිපයකටම ජලය ලබා දීමේ හැකියාව ලැබෙනවා.ඒ නිසා මගේ යෝජනාව ගරු සභාපතිතුමනි, මෙතනදි අවශ්‍ය මැදිහත්වීම ලබා දීල පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ මාර්ග නිදහස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන හැටියට මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**</u>

ඇත්තටම මේ ජල සම්පාදන මණ්ඩලය ක්‍රියාත්මක කරන වැඩ සටහනේ මටත් පොඩි ගැටලුවක් තියෙනවා. පාරවල් කඩපුව සම්බන්ධයෙන් මම නිතරම කතා කරනවා. මේ එක්තරා කොටසක් මැදින් බටදාලා මුල සහ අග එකතු කරන්නැතිවුණාට පස්සෙ මේ කොටස ඉදිකරන්න තව අවුරුදු ගානක් ගියොත් පාරවල් මේ දුෂ්කර තත්ත්වයෙන් තමයි තියෙන්නෙ. මං හිතන විදියට මේ වතුර ලබා දෙන වැඩේ තව අවුරුදු 2ක් වත් පස්සට යනවා. එතකොට මේ අනෙකුත් දේවල් ඉවර කරල තමයි වතුර දෙන්න වෙන්නෙ. ආරම්භයත් අවසානයත් නැතිව මැදින් වැඩ කරගෙන යනවා. මං ගිහින් කතා කළා. එයාල කියනවා අත්සන් කරපු ප්‍රමාණය කොන්ත්‍රාත්කරු කරගෙන යනවලු. මේකෙ බරපතල ප්‍රශ්නයක් තියෙනවා. මේ වතුර ලයින් දෙන්නෙ කවදද කියල පැහැදිලි විග්‍රහයක් කරන්නෙ නෑ. වෝටර් බෝඩ් එකේ අය එක්ක ඇවිත් මම මේක පෙන්නුවා ඉක්මනට හදන්න කියලා. මගේ මතයනම් තියෙන්නෙ මේක හදන එක නතර කරන්න ඕන. මේ කොන්ත්‍රාත්කාරයො පාරවල් කඩල හදන්නැතිව මුදල් අරගෙන ගියොත් කවුද මේ පාරවල් හදන්නෙ. මේ පාරවල් හදනව කියල මටනම් නිශ්චිත විශ්වාසයක් නෑ. අපි වෝටර් බෝඩ් එකත් එක්ක සාකච්ඡාවක් තියා ගමු.

<u>**ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර**</u>

ඇත්තටම කිව්වොත් මගේ කොට්ඨාසයේ කඩපු පාරවල් අපි හදාගත්තා.ඒ මිනිස්සු දවස් දෙකක් අවශ්‍ය විදියට වාහන යන්ත්‍ර සූත්‍ර කම්කරුවො දුන්නා. අපි පාර හදාගත්තා. හැබැයි එයාලට ප්‍රශ්නයක් තියෙනවා. කඩන්න තියෙන පාර කාපට් පාරක් නම් අනිවාර්යෙන්ම ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ඉහළ නිලධාරියෙක් ඇවිල්ලා ඒක කඩන්න කලින් මේ කොන්ත්‍රාත් සමාගමට ඒක හදන්න අනුමැතිය දෙන්න ඕන. උදාහරණයක් හැටියට ගල්ඇන්ද කුට්ටිය ප්‍රධාන පාරෙ හෙට වුණත් වතුර දෙන්න පුලුවන්. ප්‍රශ්නෙ තියෙන්නෙ ජාතික ජල සම්පාදන මණ්ඩලයේ පැල්ගොඩැල්ල කඩේ ළඟ කියන තැන මාර්ග සංවර්ධන අධිකාරියෙන් පාර කඩන්න අවසර දුන්නට පස්සෙ ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් ඇවිල්ලා අනුමැතිය දෙන්න ඕන එතන පාර කඩල ඒ ටික හදන්න. එහෙම වුණොත් විතරයි තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය පැත්තෙනුත් සම්බන්ධ කරල ඒ මාර්ගයේ බට දාපු ටිකට වතුර දෙන්න පුලුවන්කම ලැබෙන්නෙ. සභාපතිතුමා මෙතන ගැටලුවක් තියෙන්නෙ ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් අනුමැතිය දෙනවනම් බට දාපු මාර්ගවලට වතුර දෙන්න පුලුවන්. නමුත් එයාලා අනුමැතිය දෙන්නෙ නෑ. ජාතික ජල සම්පාදන මණ්ඩලයත්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියත් එකතු වුණොත් අනුමැතිය ගන්න පුලුවන් කම තියෙනවා.

<u>**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**</u>

සභාපතිතුමා අපේ සභාවේ පාපැදියක් තිබුණා ඒ දවස්වල හදිසි අවශ්‍යතාවයන් සඳහා.අද වෙනකොට ඒක සභාවේ තියෙනවද? මොකද වුණේ කියලා දැනගන්න කැමතියි. ලියුම් බෙදන්නත් ගියේ ඒකෙන්. ඒ ගැන හොයල බලන්න කියල ඉල්ලීමක් කරනවා.

හ් වගේම මාර්ග සම්බන්ධව කියනකොට වෝටර් බෝඩ් එක හෝ කොන්ත්‍රාත්කරුවෝ කිරිමැටිමුල්ල හන්දියේ සහ තවත් මාර්ග කිහිපයක කාණු කපල නිවැරදි ලෙස සකස්කරල නැහැ. කීප දෙනෙක් වැටිල අතපය කැඩිල තියෙනවා. මේ දවස් ටික තුළ කිරිමැටිමුල්ල හන්දියෙ 50 කට වඩා වැටෙන්න ඇති. මේ සම්බන්ධව යම් තීරණයක් ගන්න අවශ්‍ය නිසා ඒ කොන්ත්‍රාත් ආයතනයත් මාර්ග සංවර්ධන අධිකාරියත් සම්බන්ධ කරල ඒ කාණු කපපු මාර්ග නැවත පෙර තිබුණු ආකාරයට නිවැරදිව සකස් කරල දෙන ලෙස ඉල්ලීමක් කරන්න කියල මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

ඔය ගැටලුවට විසඳුම් සොයන්න තමයි මම සාකච්ඡාවක් කැඳෙව්වේ.අදාළ කොන්ත්‍රාත් ආයතන සමග තමයි සාකච්ඡාව පවත්වන්න ඕන. මෙයාල කැඳවන දවසට ඔය සියලු ගැටලු ඉදිරිපත් කරන්න. සියලු දෙනාම ඊට සහභාගී වන්න.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව